# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2019 දෙසැම්බර්

වෙළුම 01 නිකුතුව 08


## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





2019 දෙසැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,000 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.2 කින් පහත වැටුණි.

### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2019 දෙසැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,784 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.9 කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




2019 වසර තුළදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.4 කින් ඉහළ ගිය අතර, ආනයන වියදම සියයට 10.3 කින් පහත වැටුණි.


### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2019 දෙසැම්බර් මාසයේදී වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ වුවද, 2019 වසර තුළදී වෙළඳ හිඟය 2018 වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,346 කින් කැපී පෙනෙන ලෙස අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - 2019

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




## අපනයන පරිමා දර්ශකය (ජන.-දෙසැ.)





2019 වසර තුළදී කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහත වැටුණද කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය.


කාර්මික අපනයන සහ කෘෂිකාර්මික අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන


## කෘෂිකාර්මික අපනයන ආදායම





## කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




## තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ


තේ, කුළුබඩු, රබර්, මුහුදු ආහාර සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම දුර්වල වීම සමඟ 2019 වසර තුළදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී පොල්, එළවළු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


## කාර්මික අපනයන ආදායම





## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)





## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ ප්‍රවාහන උපකරණ අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2019 වසර තුළදී කාර්මික අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන මිල ගණන් හා පරිමාව පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී කාර්මික අපනයන පරිමාව ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)





## ආනයන පරිමා දර්ශකය (ජන.-දෙසැ.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී ආනයන වියදම පහත වැටුණි.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





විශේෂයෙන්ම පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන මෙන්ම සහල්, සීනි, කිරි නිෂ්පාදිත, පලතුරු, තෙල් හා මේද සහ පාන වර්ග වැනි ආහාර අයිතම ආනයනය පහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. මීට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළදී විදුලි සංදේශ මෙවලම්, රබර් නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග සහ ගෘහ උපකරණ වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනද පහත වැටුණි.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන.-දෙසැ.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2018 පෙබරවාරි මාසයේදී බොරතෙල් ආනයනය කර නොමැත.


ප්‍රධාන වශයෙන් රත්‍රන්, ඉන්ධන සහ මූල ලෝහ ආනයන පහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ඇඟලුම් අපනයන ඉහළ යෑමට සමගාමීව රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගිය අතර, සිමෙන්ති ක්ලින්කර ආනයන ඉහළ යෑමත් සමග ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන.-දෙසැ.)




ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | දෙසැ.-18 | දෙසැ.-19 | වෙනස (%) | ජන. - දෙසැ. 2018 | ජන. - දෙසැ. 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **216.6** | **195.4** | **-9.8** | **2,579.3** | **2,461.9** | **-4.6** |
| එයින් | තේ | 117.1 | 105.8 | -9.6 | 1,428.5 | 1,346.4 | -5.7 |
| | පොල් | 23.9 | 21.8 | -8.5 | 311.0 | 329.5 | 6.0 |
| | කුළුබඩු | 30.0 | 21.1 | -29.6 | 360.2 | 312.5 | -13.2 |
| | මුහුදු ආහාර | 29.2 | 23.9 | -18.3 | 265.8 | 262.5 | -1.3 |
| **කාර්මික අපනයන** | | **813.2** | **798.9** | **-1.8** | **9,258.2** | **9,426.3** | **1.8** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 493.4 | 483.2 | -2.1 | 5,317.7 | 5,596.5 | 5.2 |
| | රබර් නිෂ්පාදිත | 76.4 | 73.0 | -4.4 | 875.3 | 866.1 | -1.1 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 52.9 | 55.3 | 4.5 | 622.1 | 521.1 | -16.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.5 | 36.1 | -6.2 | 462.3 | 447.0 | -3.3 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 33.1 | 29.7 | -10.5 | 434.8 | 400.0 | -8.0 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 18.9 | 24.3 | 28.8 | 278.0 | 305.7 | 10.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.7 | 7.5 | -14.1 | 147.7 | 102.9 | -30.3 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.6** | **5.7** | **57.7** | **52.2** | **51.8** | **-0.7** |
| **මුළු අපනයන** | | **1,033.4** | **999.9** | **-3.2** | **11,889.6** | **11,940.0** | **0.4** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | දෙසැ.-18 | දෙසැ.-19 | වෙනස (%) | ජන. - දෙසැ. 2018 | ජන. - දෙසැ. 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **357.0** | **390.9** | **9.5** | **4,979.7** | **3,956.5** | **-20.5** |
| **ආහාර හා පාන වර්ග** | | 134.6 | 148.0 | 10.0 | 1,606.1 | 1,426.9 | -11.2 |
| එයින් | සහල් | 2.9 | 1.8 | -36.3 | 106.8 | 12.8 | -88.0 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 222.4 | 242.8 | 9.2 | 3,373.6 | 2,529.6 | -25.0 |
| එයින් | පෞද්ගලික රථවාහන | 77.3 | 83.9 | 8.6 | 1,573.5 | 815.7 | -48.2 |
| **අන්තර් භාණ්ඩ** | | **983.1** | **956.4** | **-2.7** | **12,488.0** | **11,369.6** | **-9.0** |
| එයින් | ඉන්ධන | 317.3 | 333.2 | 5.0 | 4,151.9 | 3,891.6 | -6.3 |
| | රත්‍රන් | ... | 0.1 | 4,217.7 | 438.7 | 2.6 | -99.4 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 241.5 | 248.3 | 2.8 | 2,858.5 | 2,909.4 | 1.8 |
| | පොහොර | 26.0 | 17.4 | -33.2 | 261.6 | 221.4 | -15.4 |
| | තිරිඟු හා ඉරිඟු | 24.9 | 20.1 | -19.4 | 373.5 | 346.4 | -7.3 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **394.4** | **436.9** | **10.8** | **4,765.0** | **4,610.9** | **-3.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 200.0 | 238.5 | 19.3 | 2,491.6 | 2,489.7 | -0.1 |
| **මුළු ආනයන** | | **1,734.6** | **1,784.2** | **2.9** | **22,232.7** | **19,937.1** | **-10.3** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | දෙසැ.-18 | දෙසැ.-19 | වෙනස (%) | ජන. - දෙසැ. 2018 | ජන. - දෙසැ. 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -701.2 | -784.2 | - | -10,343.1 | -7,997.1 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | දෙසැ.-18 | දෙසැ.-19 | වෙනස (%) | ජන. - දෙසැ. 2018 | ජන. - දෙසැ. 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 143.8 | 139.2 | -3.2 | 137.9 | 138.5 | 0.4 |
| | පරිමා දර්ශකය | 175.5 | 178.6 | 1.8 | 137.3 | 147.1 | 7.1 |
| | මිල දර්ශකය | 82.0 | 77.9 | -4.9 | 100.4 | 94.1 | -6.3 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 155.2 | 159.7 | 2.9 | 165.8 | 148.7 | -10.3 |
| | පරිමා දර්ශකය | 173.6 | 182.4 | 5.0 | 174.3 | 164.2 | -5.8 |
| | මිල දර්ශකය | 89.4 | 87.6 | -2.1 | 95.1 | 90.5 | -4.8 |
| **වෙළඳ මිල අනුපාතය** | | 91.7 | 89.0 | -2.9 | 105.6 | 104.0 | -1.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද